# 2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

## ආයතනයේ නම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

## වැය ශීර්ෂ අංකය 652

අන්තර්ගතය


| | | |
|---|---|---|
| පරිච්ඡේදය 01 | - | ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය |
| පරිච්ඡේදය 02 | - | ප්‍රගතිය හා ඉදිරි දැක්ම |
| පරිච්ඡේදය 03 | - | වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය |
| පරිච්ඡේදය 04 | - | කාර්ය සාධන දර්ශකය |
| පරිච්ඡේදය 05 | - | තිරසාර සංවර්ධන අරමුණු(SDG)සපුරා ගැනීමේ කාර්යසාධනය |
| පරිච්ඡේදය 06 | - | මානව සම්පත් පැතිකඩ |
| පරිච්ඡේදය 07 | - | අනුකූලතා වාර්තාව |

## 1. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 ආයතනය පිළිබඳ හැඳින්වීම

**අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව** - පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

**වැයශීර්ෂය හා නාමය** - 652 - පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

13 වන ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව යටතේ ස්ථාපිත පළාත් සභා නම් නෛතික සංවිධාන ව්‍යුහයේ තවත් එක් විෂයයක් ලෙස ඉඩම් විෂයය හඳුන්වා දිය හැකිය. 1989 වර්ෂයේ ප්‍රධාන අමාත්‍යංශය යටතේ පළාත් ඉඩම් කාර්යාලය නමින් මෙම දෙපාර්තමේන්තුව ආරම්භ විය. ආරම්භයේදී ඉඩම් අධ්‍යක්ෂක යන තනතුර යටතේ ආරම්භ වී වසරක් ඇවෑමෙන් එනම් 1990 වර්ෂයේදී දෙපාර්තමේන්තුවක් බවට පත් කරන ලදී. ඒ අනුව ඉඩම් කොමසාරිස්වරයෙකුගෙන් සමන්විතව උතුරු මැද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ලෙස මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත විය. මේ වන විට නිළධාරින් සහ සෙසු කාර්ය මණ්ඩලය 94දෙනෙකුගෙන් සමන්විත වේ. පළාත් සභාවේ ආදායම් රැස් කරන්නන් අතර ප්‍රමුඛ ස්ථානයෙහිලා සිටින මෙම දෙපාර්තමේන්තුව ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් වන ඉඩමක හිමිකම ලබාදීමේ කාර්යය සඳහා නිරන්තරව කැපවී සිටී. ඒ අනුව රජයේ ඉඩම්වල කළමනාකරණ හා පරිපාලන කටයුතු ඉඩම් සංවර්ධන ආඥා පනත ,රජයේ ඉඩම් ආඥා පනත ,ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත හා වෙනත් පනත් හා නීති රෙගුලාසි ප්‍රකාරව රජයේ ඉඩම් බැහැර කිරීම , අධීක්ෂණය, සංවර්ධනය හා සංරක්ෂණය ,යන කාර්යයන් ඉටු කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව කැපවී කටයුතු කරයි.

## 1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

"නීත්‍යානුකූල ඉඩමක්,සමෘද්ධිමත් ජනතාවක් "

**මෙහෙවර**

"නෛතික රාමුවට අනුකූලව යෝග්‍ය රජයේ ඉඩම් සුදුසුකම් සහිත ප්‍රජාවට විධිමත්ව ලබාදීම,ඉඩම්සංවර්ධනය හා සංරක්ෂණය, රජයේ ඉඩම්වල සුරක්ෂිතභාවය සුරැකීම සහ සංවර්ධනය තුලින් ආදායම ජනනය කර ගැනීම,සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිද භාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීම."

**අරමුණු**

**දිගුකාලීන අරමුණු**

1. නීත්‍යානුකූල ඉඩම් හිමිකම් සහිත ප්‍රජාවක් බිහිකිරීම.
2. ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් ලබාදෙන ආයතනයක් ඇති කිරීම.
3. ඉඩම් සම්පත ආරක්ෂා කිරීම හා එම ඉඩම් සංවර්ධන කාර්යයට දායක කර ගැනීම.
4. අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම.
5. පළාත් සභා ආදායම ඉහළ නැංවීම.


**කෙටිකාලීන අරමුණු**

1. වර්ෂයකදී දළ වශයෙන් හිමිකම් පත්‍ර 10,000 කට ආසන්න සංඛ්‍යාවක් ලබා දීම.
2. සෑම වර්ෂයකදීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම.
3. දිස්ත්‍රික්ක 02 කම ආවරණය වන පරිදි තිරසර සංවර්ධන අරමුණු මත පදනම්ව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියා කිරීම.
4. අනවසර අල්ලා ගැනීම් පෙර වර්ෂයට සාපේක්ෂව අවම කිරීම.
5. වසරින් වසර විවිධාංගිකරණය කරන ලද පුහුණු වැඩසටහන් සැලසුම් කර විවිධ අංශයන්ගෙන් දැනුම ලබා දීම.
6. ඵලදායීතා සංකල්ප හඳුන්වා දෙමින් ආයතනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

**1.3 ආයතනයේ ප්‍රධාන කාර්යයන්**

1. සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම.
2. මහජන මිත්‍රශීලී කාර්යක්ෂම සේවා සපයන ආයතනයක් බිහිකිරීම සඳහා විධිමත් ආයතනික හා මූල්‍ය පරිපාලනයක් පවත්වාගෙන යාම.
3. ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය හා ආයතනික භෞතික සම්පත් සංවර්ධනය.
4. ආයතනික යහපාලන කටයුතු සංවර්ධනය.
5. ඉඩම් වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල යටිතල පහසුකම් සංවර්ධනය.
6. විධිමත් ඉඩම් පරිහරණ රටාවක් මඟින් රජයේ ඉඩම් වල ආරක්ෂාව තහවුරු කිරීම.
7. ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය.
8. රජයේ බදු ආදායම විධිමත්ව රැස්කිරීම හා ඒ වෙනුවෙන් ක්‍රියා කිරීම.
9. නව සංවර්ධන ව්‍යාපෘතීන් හඳුනා ගැනීම සහ ඒ සඳහා සුදුසු ආයෝජකයින් යෙදවීම.


1.4 සංවිධාන සටහන


පළාත් ඉඩම් කොමසාරිස්
ඉඩම් සංවර්ධන අංශය
ආයතන අංශය
ගිණුම් අංශය
මැනුම් අංශය
නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස් (සංවර්ධන)
නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස් (පාලන)
ගණකාධිකාරී
රජයේ මිනින්දෝරු
ජ්‍යෙෂ්ඨ ඉඩම් නිලධාරි
සංවර්ධන නිලධාරි
ඉඩම් නිලධාරි
සැලසුම් ශිල්පී
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
මුදල් සහකාර
කළමනාකරණ සේවා නිලධාරී
රියදුරු
කාර්යාල කාර්ය සහයක
මැනුම් ක්ෂේත්‍ර

1.1. සේවා ජාලය

1.5.1 දෙපාර්තමේන්තු - දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ, උප කාර්යාල, ව්‍යවස්ථාපිත ආයතන හා වෙනත් ආයතන හෝ සංවිධාන

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව



<u>ආයතන අංශය</u> <u>සංවර්ධන අංශය</u> <u>ගිණුම් අංශය</u> <u>මැනුම් අංශය</u>

ප්‍රාදේශිය ලේකම්
කොට්ඨාස 24 කට
අදාල ඉඩම් රාජකාරී
කටයුතු ඉටුකරනුලබයි.

උතුරු මැද පළාත් සභා පරිපාලනය යටතේ පවතින ඉඩම් අයත්වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24ක ජීවත්වන මහජනතාව වෙත කාර්යක්ෂම සේවයක් සැපයීම සඳහා අවශ්‍ය පහසුකම්, උපදෙස් හා මගපෙන්වීම මෙම දෙපාර්තමේන්තුව මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදේ .ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඉඩම් රාජකාරී කටයුතු සඳහා ඉඩම් නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කොට ඇත. ප්‍රධාන කාර්යාලය අංශ 4ක් යටතේ රාජකාරී කටයුතු සිදුකරනු ලබන අතර සංවර්ධන අංශය හා මැනුම් අංශය මඟින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 24ට අදාල ඉඩම් රාජකාරී කටයුතු සිදු කෙරේ.

1.6 අරමුදල් ලැබෙන ප්‍රභවයන්

22 - සාමුහික ප්‍රදාන

23 - උපමාන පාදක සංවර්ධන

24 - පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන

1.7 විදේශාධාර ලබන ව්‍යාපෘති (තිබේ නම්) - නැත

## 02 .පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම සමාලෝචිත වර්ෂය තුල ආයතනය විසින් අත්කරගෙන ඇති විශේෂ ජයග්‍රහණ සපුරාගෙන ඇති ඉලක්ක (දර්ශක ඇසුරින්)

පළාත් ඉඩම් කොමසාරිස්ගේ මගපෙන්වීම හා මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව පළාත් සභා පරිපාලනයට අයත් ඉඩම් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24ක් තුල ඉඩම් රාජකාරි කටයුතු සිදුකරනු ලබයි. ඉඩම් බෙදා දීම ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ශ්‍රී ලාංකික, අඩු ආදායම් ලාභී , ගොවි පන්තියේ ප්‍රමඛත්වයක් ලැබෙන පරිදි නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා බලපත්‍ර ලබාදීම සහ රජයේ ඉඩම් ආඥා පනත යටතේ කෘෂිකාර්මික, නේවාසික,කාර්මික,වාණිජමය අවශ්‍යතාවයන් සඳහා වැඩි ආදායම්ලාභීන් හා නාගරික ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයන් සහ ආයතන වලට ඉඩම් ලබාදීම සිදු කරයි. ඒ අනුව දෙපාර්තමේන්තුව පහත දක්වා ඇති කාර්යයන් යටතේ 2023 වර්ෂයේ ක්‍රියාකාරකම් සිදුකර කර ඇත.

- සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම.
- ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා ධාරිතා සංවර්ධනය වැඩසටහන් පැවැත්වීම.
- රජයේ ඉඩම් වලින් බදු ආදායම රැස්කිරීම විධිමත් කිරීම.
- ආයෝජන කටයුතු සඳහා ඉඩම් ලබාදීම.

රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් භාවිතා කරමින් පූර්ණ උපයෝජනයක් සහතික කර ගැනීම සඳහා විවිධ ප්‍රතිපත්ති උපායමාර්ග හා ක්‍රියාකාරකම් අඛණ්ඩව අනුගමනය කර ඇත. රජය සතු ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම් පාලනය කිරීමෙන්, ඉඩම් ගැටළු විසඳීමට නීතිමය සහ තාක්ෂණික සහාය දෙපාර්තමේන්තුව විසින් ලබාදීමෙන් රජයේ ඉඩම් ප්‍රශස්ථ ලෙස උපයෝජනය සඳහා දිරිගැන්වීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර ඇත.

ඒ අනුව සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීමේ අරමුණින් ඉඩම් කච්චේරි 389 ක් පවත්වා ඇති අතර එය ඉලක්ක කල ප්‍රමාණයෙන් 69%ක ප්‍රගතියකි. මෙම ඉඩම් කච්චේරි සඳහා ලියාපදිංචි වූ පුද්ගලයින් ගණන 11501කි..

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව රැස්කළ බදු ආදායම පසුගිය වසරේ මෙන්ම මෙම වසරේද ඇස්තමේන්තු ඉලක්කයට වඩා වැඩි වී ඇත. ඉඩම් නව බදු දීම් ප්‍රමාණාත්මකව ඉහල යාම, ඉඩම් වල තක්සේරු වටිනාකම ඉහල යාම හා බදු එකතු කිරීම විධිමත් කිරීම මෙසේ බදු ආදායම වැඩිවීම සඳහා බලපෑ හේතු වන අතර ඒ අනුව 2023 වසරේදී බදු ආදායම 139%කින් වැඩිවීමක් පෙන්වා ඇත.

*මුහුණ දීමට සිදුවූ අභියෝග*

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීමට අදාලව විවිධ ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා 2023 වර්ෂයේ සැළසුම් කර තිබුණද මුලධන ප්‍රතිපාදන නොලැබීම මත ඉලක්ක කල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

.පළාත් සභා පරිපාලනය යටතේ පවතින ඉඩම් අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24 හි ඉඩම් රාජකාරී කටයුතු සඳහා නිලධාරීන් යොදවා ඇතත් තනතුරු 11 ක පුරප්පාඩු පවතී. ඒ අනුව රාජකාරී ආවරණය කරමින් කටයුතු කරගෙන යාමේ අභියෝගය පවතී.

*ඉදිරි වර්ෂ වල ලඟාකර ගැනීමට අපේක්ෂිත*

- පුද්ගලයන් වෙත හා අනෙකුත් ආයතනවල අවශ්‍යතාවලට බැහැර කිරීම සඳහා පවතින රජයේ ඉඩම් හඳුනාගැනීම යටතේ ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම හා රජයේ ඉඩම් භුක්ති විඳින අනවසරකරුවන් වෙත ඉඩම් අයිතිය නියාදනය කිරීම සඳහා පවතින නීති රෙගුලාසි අනුව කඩිනමින් කටයුතු කිරීම.
- රජයේ ඉඩම් තොරතුරු පිළිබඳව දත්ත බැංකුවක් සකස් කිරීම.

- ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-slims) මඟින් මාර්ගගත ක්‍රමය ඔස්සේ දීමනාපත්‍ර සකස් කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරන අතර ඉඩම් කච්චේරි පැවැත්වීමේ ක්‍රියාවලියද මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත.

- ඉඩම් බදු ආදායම් ඉපයීම කාර්යක්ෂම කිරීම සඳහා සියළු බදු කරුවන්ගේ දත්ත රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට (e-slims) ඇතුල් කිරීම.

- රජයේ ඉඩම්වල පවතින රජයේ දෙපාර්තමේන්තු හා වෙනත් රජයේ ආයතන, ත්‍රිවිධ හමුදාවට අයත් ආයතන, බෞද්ධ විහාරස්ථාන හා අනෙකුත් ආගමික ස්ථාන ආදිය සඳහා ඉඩම් පවරාදීම කඩිනම් කිරීම.

- අනුග්‍රාහික පදනමින් කෘෂිකාර්මික, වාණිජ හා කාර්මික කටයුතු සඳහා ඉඩම් බදු දීම මඟින් පළාතේ ආර්ථික සංවර්ධනය උදෙසා දායක වීම.

- බදු ආදායම රැස්කිරීම විධිමත් කිරීම සඳහා බදුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා නියමිත පරිදි බදු ගෙවීමේ වැදගත්කම පහදාදීම හා බදුකරුවන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම මඟින් දැනට පවතින හිඟ බදු ආදායම එක්රැස් කිරීමටත් බදු ගෙවීම පැහැර හරින්නන් සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීමට කටයුතු කිරීම.
- රජයේ ඉඩම්වල පවතින ගල්,බොරළු කැණීම් කිරීමෙන් පසු අත්හරින ලද ස්ථාන වැනි ඌන භාවිත ඉඩම් ඵලදායී ව්‍යාපෘති සඳහා යොදා ගැනීමට හැකි අයුරින් සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම.

  උදා :කාබනික වගා ව්‍යාපෘති ,කසළ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘති ,සූර්ය බල පද්ධති වැනි ව්‍යාපෘති සඳහා බදු අයකිරීමේ පදනමින් ඉඩම් බැහැර කිරීම.
- රජයේ ඉඩම් වල වටිනාකම ඉහළ නැංවීම සඳහා එකී ඉඩම් ඵලදායීව සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර එමඟින් මහජනතාවට අවශ්‍ය භෞතික පහසුකම් වැඩි දියුණු කිරීම.
- දැනටමත් බැහැර කර ඇති සංවර්ධනය කර නොමැති රජයේ ඉඩම් (දීර්ඝකාලීන බදු බලපත්‍ර , දීමනාපත්‍ර ,ඉඩම් සංවර්ධන ආඥා පනතින් ලබාදුන් බලපත්‍ර) නැවත රජයට ලබා ගැනීමට හෝ සුදුසුකම් සහිත ආයෝජකයින් වෙත ලබාදීම හෝ මඟින් එම ඉඩම් සංවර්ධන කාර්යයට දායක කර ගැනීම සඳහා සුදුසු ජාතික වැඩපිළිවෙලක් සකස් කිරීම.
- රජයේ ගොඩනැගිලි) උදා :පාසල් ,රෝහල, විවිධ රාජ්‍ය ආයතන හා රජයේ ආයතන වෙත ලබාදී ඇති ඉඩම් ඵලදායී ව්‍යාපෘති සඳහා යෙදවීමට හැකිවන පරිදි සුදුසු ක්‍රමවේදයක් සැකසීම.

  උදා : රජයේ ගොඩනැගිලි වල පියසි මත සූර්ය කෝෂ ස්ථාපනය කර සූර්ය ශක්තියෙන් විදුලිය උත්පාදනය කිරීම සඳහා සුදුසු ආයතන වෙත බදු දීමට කටයුතු කිරීම.

- රජයේ ඉඩම් නීතිය ඉතා සංකීර්ණ ස්වාභාවයක් ගෙන ඇති බැවින් ඒ පිළිබඳව රජයේ නිලධාරීන් මෙන්ම පොදු මහජනතාව නිරන්තරයෙන්ම දැනුවත් කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම.

# 3. පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2023/12 හා 2023.12.29 දිනැති චක්‍රලේඛය අනුව විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල අඩංගු එන්සීපී-පීටී(එෆ්) ආකෘතියේ පරිලෝකන (ස්කෑන්) පිටපතක්

එන්සීපී-පීටී (එෆ්)

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2023 | | සටහන | සතය 2023 | 2022 | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 1 | - | - | ආර-1 |
| 215,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 2 | 299,239,209 | 221,599,700 | ආර-1 |
| 215,000,000 | මුළු ආදායම් ලැබීම් (අ) | | 299,239,209 | 221,599,700 | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 74,550,000 | 69,100,000 | ඊ-1 |
| - | තැන්පතු | | 36,898 | 232,650 | ඊ-2 |
| 3,400,000 | අත්තිකාරම් ලැබීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් | | 4,204,498 | 4,499,232 | ඊ-3 |
| - | අත්තිකාරම් ලැබීම් - අනෙකුත් අත්තිකාරම් | | - | - | ඊ-3 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| 3,400,000 | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 78,791,396 | 73,831,882 | |
| 218,400,000 | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 378,030,605 | 295,431,582 | |
| 124,335,800 | භාණ්ඩාගාරයට අප්‍රේෂණ (ඈ) | | 2,139,872 | 59,305 | |
| 94,064,200 | (ඉ) | | 375,890,733 | 295,372,277 | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 67,036,400 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 3 | 64,856,141 | 64,128,716 | ට-3 |
| 20,587,800 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 4 | 19,333,834 | 17,192,915 | ට-3 |
| 440,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 5 | 396,069 | 485,000 | ට-3 |
| 88,064,200 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 84,586,045 | 81,806,631 | |
| | **මූලධන වියදම්** | | | | |
| 1,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 6 | - | - | ට-3 |
| 500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 7 | 479,000 | - | ට-3 |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 8 | - | - | ට-3 |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම් | 9 | - | - | ට-3 |
| - | හැකියා වර්ධනය | 10 | - | - | ට-3 |
| - | වෙනත් මූලධන වියදම් | 11 | - | - | ට-3 |
| 1,500,000 | මුළු මූලධන වියදම් (උ) | | 479,000 | - | |
| - | තැන්පතු ගෙවීම් | | 255,574 | 539,500 | ඊ-2 |
| 4,500,000 | අත්තිකාරම් ගෙවීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් | | 3,828,606 | 5,335,428 | ඊ-3 |
| - | අත්තිකාරම් ගෙවීම් - අනෙකුත් අත්තිකාරම් | | - | - | ඊ-3 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| 4,500,000 | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 4,084,180 | 5,874,928 | |
| 94,064,200 | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 89,149,224 | 87,681,559 | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | 286,741,509 | 207,690,718 | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ගැලපුම් ශේෂය | | 286,741,509 | 198,328,862 | ඊ-5 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | | ඊ-1 |
| | | | 286,741,509 | 198,328,862 | |

[illegible]
දිනය 2024.02.27

[illegible]
දිනය 2024.02.26

කේ.ඒ.සී. ප්‍රියදර්ශනී
ගණකාධිකාරී (වැ.බ)
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
උතුරු මැද පළාත
දිනය 2024.02.26

ඩී.ආර්.ඒ.ඩබ්.සී. රණසිංහ
ඉඩම්,වාරිමාර්ග,මාර්ග සංවර්ධන,ග්‍රාම සංවර්ධන,
... කාර්ය කටයුතු අමාත්‍යාංශය.
උතුරු මැද පළාත.

## 3.2 මූල්‍යතත්ත්වයපිළිබඳ ප්‍රකාශය

පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2023/12 හා 2023.12.29 දිනැති චක්‍රලේඛය අනුව විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල අඩංගු එන්සීපී-පීටී(පී) ආකෘතියේ පරිලෝකන (ස්කෑන්) පිටපතක්

එන්සීපී-පීටී (පී)

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | සත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | එන්සීපී-පීටීඑෆ්-4 | 51,003,241 | 50,599,890.80 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් - ප.රා.නි. අත්තිකාරම් | එන්සීපී-පීටීඑෆ්-3 | 14,121,733 | 14,497,625.00 |
| අනුදත් අත්තිකාරම් ගිණුම් | එන්සීපී-පීටීඑෆ්-3 | - | - |
| මුදල් හා මුදල් සමාන දෑ | එන්සීපී-පීටීඑෆ්-1 | - | - |
| මුළු වත්කම් | | 65,124,974 | 65,097,516 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| පළාත් භාණ්ඩාගාර(යට/යෙන්) පියවියයුතු/ ලැබියයුතු ශුද්ධ වත්කම | | 14,121,733 | 14,278,949.00 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 51,003,241 | 50,599,890.80 |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | එන්සීපී-පීටීඑෆ්-2 | - | 218,676.00 |
| අග්‍රිම ශේෂය | එන්සීපී-පීටීඑෆ්-1 | - | - |
| මුළු වගකීම් | | 65,124,974 | 65,097,516 |

පිටු අංක 6 සිට 30 දක්වා එන්සීපී-පීටීආර්(1) සිට එන්සීපී-පීටීපී(7) දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 31 සිට 36 දක්වා ඇතුළත් අනෙකුත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර, මෙහිදී මූල්‍ය ප්‍රකාශණයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. එබැවින් ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම්පොත් සමග සැසඳීම් කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමග එකඟ වන බවටත්මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : පී.ජේ.ආර්.ඒ.ඩබ්.සී.රණසිංහ මයා
තනතුර : ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යංශය
දිනය : 2024.02 27

පී.ජේ.ආර්.ඒ.ඩබ්.සී. රණසිංහ
ලේකම්
පළාත් ඉඩම්,වාරිමාර්ග,මාර්ග සංවර්ධන,ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශය.
උතුරු මැද පළාත.

ගණන්දීමේ නිලධාරී
නම : ජී.ඒ.කිත්සිරි මයා
තනතුර : පළාත් ඉඩම් කොමසාරිස්
දිනය : 2024.02. 26

ජී.ඒ. කිත්සිරි
පළාත් ඉඩම් කො...
පළාත් ඉඩම් කොමසාරිස් දෙ...තුව
උතුරු මැද පළාත

~~ප්‍රධාන මූල්‍ය නිලධාරී~~/ප්‍රධාන ගණකාධිකාරී/
~~අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)~~
නම : කේ.ඒ.සී.ප්‍රියදර්ශනී මෙය
දිනය : 2024.02.26

කේ.ඒ.සී. ප්‍රියදර්ශනී
ගණකාධිකාරී (වැ.බ)
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
උතුරු මැද පළාත

### 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පළාත් භාණ්ඩාගාර චක්‍රලේක අංක 2023/12 හා 2023.12.29 දිනැති චක්‍රලේඛය අනුව විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල අඩංගු එන්සීපී-පීටී(සී) ආකෘතියේ පරිලෝකන (ස්කෑන්) පිටපතක්

එන්සීපී-පීටී (සී)

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන 2023 රු. | 2022 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | 167,533 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් - වැන්දඹු අනත්දරු දායක | 2,498,872 | 2,513,274 |
| වෙනත් පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 826,399 | 756,059 |
| අග්‍රිම ලැබීම් | 74,550,000 | 69,100,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 4,416,915 | 5,081,612 |
| අත්තිකාරම් අයකර ගැනීම් - අනුදත් අත්තිකාරම් ගිණුම් | - | - |
| තැන්පතු ලැබීම් | 36,898 | 232,650 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **82,329,083** | **77,851,128** |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 75,049,318 | 71,423,795 |
| සහනාධාර සහ මාරුකිරීම් | 396,069 | 485,000 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද මෙහෙයුම් වියදම් | - | |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 2,139,872 | 59,305 |
| අත්තිකාරම් ගෙවීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 4,009,250 | 5,335,428 |
| අත්තිකාරම් ගෙවීම් - අනුදත් අත්තිකාරම් ගිණුම් | - | - |
| තැන්පතු ගෙවීම් | 255,574 | 539,500 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **81,850,083** | **77,843,028** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **479,000** | **8,100** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොලී (වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් එකතු කරන ලද ආදායම්) | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම (වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් එකතු කරන ලද ආදායම්) | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **-** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 479,000 | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් වියදම් | - | 8,100 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **479,000** | **8,100** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(479,000)** | **(8,100)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **(0)** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ) +(ඒ)** | **(0)** | **(102,473)** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **102,473** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **(0)** | **-** |

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : පී.ජේ.ආර්.ඒ.ඩබ්.සී.රණසිංහ මයා
පී.ජේ.ආර්.ඒ.ඩබ්.සී. රණසිංහ
ලේකම්
උතුරු මැද පළාත.

ගණන්දීමේ නිලධාරී
නම - පී.ඒ කිත්සිරි
පී.ඒ. කිත්සිරි
පළාත් ඉඩම් කොමසාරිස්
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
උතුරු මැද පළාත

ගණකාධිකාරී/
දිනය : 2024.02.26
කේ.ඒ.සී. ප්‍රියදර්ශනී
ගණකාධිකාරී (වැ.බ)
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### 3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

පළාත් භාණ්ඩාගාර චක්‍රලේක අංක 2023/12 හා 2023.12.29 දිනැති චක්‍රලේඛය අනුව වාර්තා කිරීමේ පදනම දැක්වෙන ආකෘතිය

__වාර්තා කිරීමේ පදනම__

1) __වාර්තාකරණ කාලපරිච්ඡේදය__

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) __මිනුම්කරණ පදනම__

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) __ආදායම් හඳුනාගැනීම__

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) __දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම__

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) __දේපළ, පිරියත හා උපකරණ සංචිතය__

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) __මුදල් හා මුදල් සමාන දෑ__

2023 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

### 3.5ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද මුළු ආදායම (රු.) | එකතු කරන ලද මුළු ආදායම අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | | |
| 2002-01-03 | ඉඩම් හා අනෙකුත් බලපත්‍ර ගාස්තු | 215,000 | 215,000 | 299,240 | 139% |

### 3.6ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝජනය කරනු ලැබූ ප්‍රතිපාදනය වෙන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| **පුනරාවර්තන** | 91,465 | 88.064 | 84.586 | 96% |
| **මූලධන** | 1,500 | 1.500 | 479 | |

| වැඩසටහන් නාමය * | පුනරාවර්තන | | | මූලධන | | |
|---|---|---|---|---|---|---|
| | 2023වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | 2023වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම |
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | |
| ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | **91,465** | **88,064** | **84,586** | 1,**500** | **1,500** | **479** |
| | | | | | | |

*වාර්ෂික මුදල් ප්‍රකාශයේ පිටු අංක **XIV** හි වර්ගීකරණය අනුව.

**3.7ප.මු.රී 140 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේනතු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝනය කර ගන්නා ලද ප්‍රතිපාදන, වෙන් කර දුන් අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය | මිලදී ගැනීම් | | | | |

**3.8මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා වැය විෂයට ගිණුම් ගතවූ ශේෂය | 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා වත්කම් කළමනාකරණ මෘදුකාංගයට ඇතුලත් කල ශේෂය | 2023.12.31 දිනට වියදම් ලෙස ගිණුම් ගත උවද වත්කමක් ලෙස වාර්තා නොවූ ශේෂය (වත්කම් කළ.මෘදුකාංගයට ඇතුලත් නොවූ වටිනාකම) | වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරණ ලද වියදම වත්කම් කළ. මෘදු.හරහා වාර්තා කිරීමේ ප්‍රගතිය % ලෙස |
|---|---|---|---|---|---|
| 2101 | වාහන | - | - | - | - |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | - | - | - | - |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | - | - | - | - |
| 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | - | - | - | - |
| 2105 | ඉඩම් අත්පත් කර ගැනීම | - | - | - | - |
| 2106 | වෙනත් මූලධන වත්කම් | - | - | - | - |
| 2107 | යටිතල පහසුකම් වත්කම් | - | - | - | - |
| 2108 | කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම | - | - | - | - |
| 2109 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN)කොට මෙහි අන්තර්ගත කළ යුතුය

2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් අවසාන විගණන වාර්තාව මෙතෙක් ලැබී නොමැත.

## 04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

ආයතනයේ කාර්ය සාධන දර්ශක - ක්‍රියාකාරී සැළැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)ලෙස | | |
|---|---|---|---|
| | **100%- 90%** | **75%-89%** | **50%- 74%** |
| මහජනතාව වෙත ලබාදුන් ඉඩම් හිමිකම්පත් ගණන | 108.2 | | |
| පළාත් සහා ඉඩම් වලින් උපයන ලද වාර්ෂික බදු ආදායම | 139 | | |
| පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන | | 75.3% | |

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් ආයතනයේ කාර්යයන් මැන බැලීම සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක කිහිපයක් හඳුනාගෙන ඇත.

- මහජනතාව වෙත ලබාදුන් ඉඩම් හිමිකම්පත් ගණන
- පළාත් සහා ඉඩම්වලින් උපයන ලද වාර්ෂික බදු ආදායම
- පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන

රජයේ ඉඩම් වල අයිතිය බැහැර කිරීමේදී රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් සංවර්ධන ආඥා පනතට අනුව අනවසරයෙන් භුක්ති විඳින ලද ඉඩම් නීත්‍යානුකූල කිරීම සඳහා කච්චේරි පවත්වා සුදුස්සන් තෝරාගෙන ඔවුන් සඳහා ඉඩම් හිමිකම ලබාදේ. 2023 වසරේදී නිලධාරීන්ගේ කැපවීම හා උත්සහය මත ඉලක්ක කළ ඉඩම් කච්චේරි ප්‍රමාණයෙන් 424ක් පවත්වා ඇති අතර 75.3% නිමවුමක් කරා යාමට හැකියාව ලැබුනි. ඒ අනුව ඉලක්ක කල ප්‍රමාණයටවඩා හිමිකම්පත් (බලපත්‍ර/දීමනාපත්‍ර/දීර්ඝකාලීන බදු බලපත්‍ර/නිදහස්දීමනාපත්‍ර) ලබාදීමට හැකියාව ලැබුනි. ඒ අනුව හිමිකම්පත් 8663ක් බෙදාදීමට සැළසුම් කලද 9376 ක් මහජනතාව වෙත ලබාදීමට හැකි විය.එය 108.2%ක ප්‍රතිශතයකි. දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ ඉඩම් ලබාදීම වර්තමානයේ ඉහළ ගොස් ඇත.එමෙන්ම මධ්‍යකාලීන හා දිගු කාලීන ආයෝජන අවස්ථා සඳහා රජය සතු ඉඩම් ලබාදීම සිදු කරයි.රජයේ ඉඩම් සම්පත ප්‍රශස්ත කළමනාකරණය තුලින් රාජ්‍ය බදු ආදායම් ව්‍යුහය ශක්තිමත් කිරීමෙහිලා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල එක්ව

කටයුතු කරනු ලබයි. එහිදී නව බදු ආදායම් හා හිඟ බදු ආදායම් ලෙස වෙන් වෙන්ව බදු ගණනය කර ඒවා නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.2023 වර්ෂයේදී බදුකරුවන්ගෙන් නියමිත කාලවකවානුව තුල බදු අයකර ගැනීමේ කටයුතු විධිමත් කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් සිදුකරන ලද අතර එමඟින් මෙම වසරේදී උපයන ලද බදු ආදායම 139%ක වැඩිවීමක් පෙන්වා ඇත.ඒ අනුව මෙම වසරේදී ඉඩම් බදු ඉපයීමේ කාර්යයේදී ඉහළ කාර්යසාධන මට්ටමකට ලඟා වීමට හැකි වී ඇත.

**05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය**

**5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.**

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලඟාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2023 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 01. සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම. | සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම./මහජනතාව වෙත ඉඩම් හිමිකම්පත් ලබාදීම | ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉඩම් කච්චේරි පැවැත්වීම. | | | 75.3 % |
| 17.ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේපුනර්ජීවනය | රජයේ බදු ආදායම විධිමත්ව රැස්කිරීම | බදුකරුවන්ගෙන් නියමිත කාල වකවානුව තුල බදු අයකර ගැනීමේ කටයුතු විධිමත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල යාවත්කාලීනවී නොමැති බදු ගොනු හඳුනාගැනීම හා යාවත්කාලීන කිරීම ,බදුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | | | 139 % |

## 5.2. තිරසර සංවර්ධන අරමුණු (SDG)සපුරා ගැනීමේ කාර්ය සාධනය

ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද අංක 2008/4 හා 2008/4(1) චක්‍රලේඛය අදාල කර ගනිමින් රජයේ ඉඩම් මහජනතාව වෙත බැහැර කිරීම ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගොවි පන්තිය හා ගොවි පන්තිය නොවන කාණ්ඩ වලට අයත් පුද්ගලයන් වෙත නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා බලපත්‍ර ලබාදීම සහ රජයේ ඉඩම් ආඥා පනත යටතේ කෘෂිකාර්මික ,නේවාසික, කාර්මික, වානිජමය අවශ්‍යතාවයන් සඳහා වැඩි ආදායම්ලාභීන් හා නාගරික ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයන් වෙත ඉඩම් ලබාදීමත් ආයතනවලට ඉඩම් ලබාදීමත් සිදුකරයි.ඉඩම් නොමැති පුද්ගලයන් හඳුනාගෙන ලියාපදිංචි කිරීමේ වැඩ පිළිවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් 2023 වර්ෂයේදීත් ක්‍රියාත්මක කරන ලදි. සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීමේ අරමුණින් ඉඩම් කච්චේරි **543** ක් පැවැත්වීම සඳහා 2023 වර්ෂයේ ඉලක්ක කළ අතර එකී ඉලක්කය සපුරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි නිලධාරීන් උනන්දු වී කටයුතු කර ඇත. ඒ අනුව 2023 වසරේදී ග්‍රාම නිලධාරී වසම් 292ක් ආවරණය කරමින් ඉඩම් කච්චේරි 435ක් පවත්වා ඇත. මේ සඳහා ලියාපදිංචි වූ පුද්ගලයින් 14294 ක් අතරින් 10490ක් සුදුසුකම් ලබා ඇත. අනුව බලපත්‍ර, දීමනාපත්‍ර, දීර්ඝකාලීන බදු බලපත්‍ර හා නිදහස් දීමනාපත්‍ර ඇතුලත්ව පුද්ගලයන් වෙත බෙදා දෙන ලද හිමිකම්පත් ගණන 5175කි.

රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු කාර්යක්ෂම කරලීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් රජයේ ඉඩම් තොරතුරු කළමණාකරණ පද්ධතිය(e-Slims) හඳුන්වා දී ඇත.රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙම පද්ධතියට ඇතුලත් කිරීමට කටයුතු සිදු කරන අතර ඉඩම් බෙදාදී ලියකියවිලි නිකුත් කිරීම හා ආදායම් රැස් කිරීමේ ක්‍රියාවලියද බෙදාදුන් ඉඩම් වලට අදාල පසු කටයුතු හා අධීක්ෂණ කටයුතු මෙම පද්ධතිය මඟින් සිදු කිරීමේ හැකියාව ඇත.ඒ අනුව 2023 වර්ෂය අවසානය වන විට පළාත් සභාවට අයත් ඉඩම් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සියල්ලේම දීමනාපත්‍ර සකස් කිරීමේ කටයුතු e-Slims පද්ධතිය ඔස්සේ සිදු කිරීමට පියවර ගෙන ඇති අතර ඒ අනුව දීමනාපත්‍ර 612ක් සකස් කිරීම සඳහා නිර්දේශ යොමුකර ඇත.

ඉඩම්ලාභීන්ගේ ඉඩම් ආශ්‍රිතව පැන නැගී ඇති ගැටළුවලට රාජ්‍ය නිලධාරීන් මැදිහත් වී උපදෙස් සැපයීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8ක ජංගම සේවා වැඩසටහන් 12ක් පවත්වා පුද්ගලයින් 670කගේ නොවිසඳුන ඉඩම් ගැටළු 329ක් සඳහා විසඳුම් ලබාදීමට කටයුතු කර ඇත. නේවාසික කෘෂිකාර්මික, සහ වානිජ කටයුතු සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ට,

පුද්ගලයන්ට රජයේ ඉඩම් බදු දී රාජ්‍ය බදු ආදායම් ව්‍යුහය ශක්තිමත් කිරීමේ ක්‍රියාවලිය පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල එක්ව ඉටුකරනු ලබයි. ඒ අනුව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව රැස්කළ බදු ආදායම පසුගිය වසරේ මෙන්ම මෙම වසරේද ඇස්තමේන්තු ඉලක්කයට වඩා වැඩි වී ඇත. ඉඩම් බදු ආදායම් පිළිබඳව පුරෝකථනය කිරීමේදී නව බදු ආදායම් රැස් කිරීම සහ හිඟ බදු ආදායම් රැස් කිරීම වෙන් වෙන්ව සලකනු ලබන අතර ඒ අනුව 2023 වසරේදී මෙම දෙඅංශයෙන්ම උපයන ලද බදු ආදායම රු.මි. 299කි.මෙය ඉලක්ක කල ආදායමින් 139%ක වැඩිවීමකි.

**පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ**

6.1 **සේවක සංඛ්‍යා කළමනාකරණය**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 5 | 3 | 2 |
| තෘතියික | 3 | | 3 |
| ද්විතියික | 86 | 73 | 13 |
| ප්‍රාථමික | 15 | 12 | 4 |

**6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

පළාත් සභා පරිපාලනය යටතේ පවතින ඉඩම් අයත්වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24හි ජීවත්වන මහජනතාව වෙත කාර්යක්ෂම සේවයක් සැපයීම සඳහා අවශ්‍ය පහසුකම් ,උපදෙස් හා මඟපෙන්වීම මෙම දෙපාර්තමේන්තුව මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදේ .ඒ අනුව රජයේ ඉඩම්වල කළමනාකරණ හා පරිපාලන කටයුතු ඉඩම් සංවර්ධන ආඥා පනත ,රජයේ ඉඩම් ආඥා පනත ,ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත හා වෙනත් පනත් හා නීති රෙගුලාසි ප්‍රකාරව රජයේ ඉඩම් බැහැර කිරීම , අධීක්ෂණය ,සංවර්ධනය හා සංරක්ෂණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 24හි සිදුකරනු ලබන අතර ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ඉඩම් නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කොට ඇත.

එසේ වුවද දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයේ සහකාර ඉඩම් කොමසාරිස්, මිනින්දෝරු, සංවර්ධන නිලධාරීන්, හා ඉඩම් නිලධාරීන්, රියදුරු, කා.කා.ස හා මැනුම් සහයක

යන තනතුරු ඇතුලත් වන පරිදි 2023.12.31 දිනට පුරප්පාඩු 21 ක් පැවතිනි. මෙවැනි සේවක පුරප්පාඩු පැවතිම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ රාජකාරී වල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා බාධාවක් වී ඇත. එසේ වුවත් විධිමත් කළමනාකරණයකින් යුතුව ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නිලධාරීන් විශේෂ උනන්දුවකින් හා කැපවීමෙන් කටයුතු කරමින් ආයතනයේ කාර්ය සාධනයඉහළ නැංවීම සඳහා කටයුතු ඉටු කරනු ලබයි.

**6.3 මානව සම්පත් සංවර්ධනය**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව(දින/ මාස/ අවු.) | සමස්ත ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය /විදේශීය) | නිමවුම / ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ඉඩම් තක්සේරු පිළිබඳ පුහුණු වැඩසටහන | 80 | වැඩසටහන්1 දින 1 | 71,550 | | දේශීය | ඉඩම් තක්සේරුකරණය පිලිබද නිළධාරීන් දැනුවත් කර ඉඩම් හිමිකම්පත්‍ර ලබා දීම කඩිනම් කිරීම |

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වූයේ කෙසේද? යන්න කෙටියෙන් පැහැදිලිකරන්න

ආයතනික අරමුණු හා උපායමාර්ග ඉටුකර ගැනීමට අවශ්‍ය මානව සම්පත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස උපයෝජනය කිරීම පරමාර්ථ කොට ගෙන ආයතනයක් විසින් නිලධාරින් සඳහා පුහුණුවීම් ලබාදීම සිදුකරයි දැනුම, කුසලතා, ආකල්ප වලින් පරිපූර්ණ රාජ්‍ය නිලධාරියකුගෙන් මහජනයාට ලැබෙන සේවාව අතිමහත්ය.ජනතාවගෙන් වැටුප් ලබන රාජ්‍ය සේවකයා තුල එවැනි පරිපූර්ණත්වයක් ඇති කිරීම උදෙසා පුහුණුව වැදගත් අංගයක් සේ සැළකිය හැකිය. ඉඩම් රාජකාරී ගත්විට දීර්ඝ ක්‍රියාවලියක් හා අණ පනත් රාශියක් සමග බැදුණු කාර්යයක් බැවින් නිලධාරීන් ඊට අදාල දැනුමෙන් සන්නද්ධ වී සිටීම හා දැනුම යාවත්කාලීන කර ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.විවිධ අවස්ථාවන් වලදී නිලධාරීන් පුහුණු කළද නව නිලධාරීන් බඳවා ගැනීම්, ස්ථානමාරු යනාදි කරුණු නිසා පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව මඟින් නිරන්තරයෙන් නිලධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පවත්වන අතර මෙම වසරේදී පුහුණු වැඩසටහන ක් පවත්වා සියළුම කාර්ය මණ්ඩල නිලධාරීන් පුහුණු කර ඇත.

## 07.අනුකූලතා වාර්තාව

### 04 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදළකරගතයුතුඅවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සදහන් මුල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේද?** | | | |
| 1.1 | වාර්ෂික මුල්‍ය ප්‍රකාශ | √ | | |
| 1.2 | රාජ්‍ය නිළධාරින්ගේ අත්තිකාරම් ගිණුම | √ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | | | |
| 1.6 | වෙනත් ගිණුම් | | | |
| | | | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(ප.මු.රී 321)** | | | |
| 2.1 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 2014/14 හා 2016/10 අනුව ස්ථාවර වත්කම් ලේඛණයයාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 2.2 | පුද්ගලික පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | √ | | |
| 2.3 | විගණනවිමසුම් ලේඛනය යාවත්කාලිනකර පවත්වාගෙන යාම | √ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | √ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට පළාත් භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | √ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම(ප.ස 37 පෝරමය) | √ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (ප.ස 32 පෝරමය) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| | | | | |
| 3 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (ප.මු.රී 83)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම | √ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | √ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා සිදුවන පරිදී බලතල පවරාදී තිබීම | √ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණරාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | √ | | |
| 3.5 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2022.11.23 දිනැතිව නිකුත් කර ඇති අංක 04/2022 චක්‍රලේඛය හා 2023.01.05 දිනැතිව පළාත් භාණ්ඩාගාර විසින් නිකුත් කර ඇති NCP/CS/PT/ICTO/GPS දරන ලිපියට අනුකූලව GPS මෘදුකාංගය හරහා වැටුප් සකස් කිරීම | √ | | |
| | | | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | නියමිත දිනට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | √ | | |
| 4.2 | නියමිත දිනට වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | √ | | |
| 4.3 | නියමිත දිනට වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | √ | | |
| 4.4 | නියමිත දිනට වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට පළාත් අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | √ | | |
| 4.5 | නියමිත දිනට වාර්ෂික අග්‍රිම සීමා වාර්තාව පළාත් භාණ්ඩාගාර ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | √ | | |
| | | | | |
| 5 | **විගණනවිමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම | √ | | |
| | | | | |
| 6 | **අභ්‍යන්තරවිගණනය** | | | |
| 6.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, වසර ආරම්භයේ දී අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | √ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ පිළිතුරු සපයා තිබීම | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.3 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | | | |
| | | | | |
| 7 | **විගණන හා කළමණාකරණ කමිටු** | | | |
| 7.1 | DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබිම | √ | | |
| | | | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | පළාත් සභාව සතු වත්කම් කළමනාකරණය සම්බන්ධ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2014/14 හා 2016/10 අනුව වත්කම් මිලදී ගැනීම, නිකුත් කිරීම හා අපහරණය කිරීම පිළිබඳ කටයුතු කර තිබීම | √ | | |
| 8.2 | කොන්ට්‍රෝල ජනරාල්ගේ අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | √ | | |
| 8.3 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක2022/08 අනුව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම | √ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තය, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | √ | | |
| 8.5 | ගර්හිතභාණ්ඩ අපහරණය කිරිම ප.මු.රී 490 අනුව සිදු කිරිම | √ | | |
| 8.6 | කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ 2022.09.09 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 10/2022 ප්‍රකාරව ආයතනයේ එකත් වී ඇති අබලි ද්‍රව්‍ය බැහැර කර තිබීම | √ | | |
| | | | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | √ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | √ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම ප.මු.රී 54 ප්‍රකාරව කටයුතු කිරීම | √ | | |
| 9.5 | ප්‍රධාන ලේකම්ගේ NCP/CP/FD/08 හා 2017.08.08 දිනැති ලිපිය ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම | | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | | | |
| | | | | |
| 10 | <u>**බැංකු ගිණුම් කළමනාකරණය**</u> | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | √ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | √ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | √ | | |
| | | | | |
| 11 | <u>**ප්‍රතිපාදන උපයෝජනය**</u> | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | √ | | |
| 11.2 | ප.මූ.රී. 46 ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදී බැරකම්වලට එලඹීම | | | |
| | | | | |
| 12 | <u>**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**</u> | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | √ | | |
| 12.2 | හිඟහිටිණයශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | √ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | | | |
| | | | | |
| 13 | <u>**පොදු තැන්පත් ගිණුම**</u> | | | |
| 13.1 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කිරීම | √ | | |
| 13.2 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 572 අනුව කටයුතු කිරීම | √ | | |
| | | | | |
| 14 | <u>**අග්‍රිම ගිණුම**</u> | | | |
| 14.1 | ප.මූ.රී. 259 අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය පළාත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබීම | √ | | |
| 14.2 | ප.මූ.රී. 261 ප්‍රකාරව, නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාරයය අවසන් වී සතියක් ඇතුළත නිරවුල් කර තිබීම | √ | | |
| 14.3 | ප.මූ.රී. 261 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | √ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| 15 | **<u>ආදායම් ගිණුම</u>** | | | |
| 15.1 | ප.මු.රී.133ට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | √ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට රැස් කරනු ලබන අවස්ථාවේම ඍජුවම ආදායමට බැර කර තිබීම | √ | | |
| 15.3 | ප.මු.රී. 116 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | √ | | |
| | | | | |
| 16 | **<u>මානව සම්පත් කළමනාකරණය</u>** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ පවත්වාගෙන යාම හා වැටුප් ගෙවීම | √ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | √ | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| | | | | |
| 17 | **<u>මහජනයා වෙත තොරතුරු ලබා දීම</u>** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | √ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා හෝ ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | √ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | √ | | |
| | | | | |
| 18 | **<u>පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම</u>** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (I)දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරිම | √ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | √ | | |
| | | | | |
| 19 | **<u>මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම</u>** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | √ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | √ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | √ | | |
| | | | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | √ | | |

.

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. NCPC/D/DLC/FA2023/2024/05 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2024 අප්‍රේල් 30 දින.

07 MAY 2024

පළාත් ඉඩම් කොමසාරිස්,

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,

උතුරු මැද පළාත.

07 MAY 2024

ශීර්ෂය - 652 - පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ජේ.ඒ.එස්.ඇනස්ටින්,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට

ජේ.ඒ.එස්. ඇනස්ටින්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත්:- නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) - උතුරු මැද පළාත් සභාව

FA


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. NCPC/D/DLC/FA2023/2024/05    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2024 අප්‍රේල් 30 දින.

පළාත් ඉඩම් කොමසාරිස්,

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,

උතුරු මැද පළාත.

ශීර්ෂය - 652 - පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

---

01. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ 2023 දෙසැම්බර් 29 දිනැති අංක 2023/12 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර ඉදිරිපත් කරන ලද 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. මෙහි ඇතුළත් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ, පළාත් සභාවේ අනෙකුත් ආයතනවලින් අනාවරණය වන ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සමඟ සම්පිණ්ඩනය කර පළාත් සභාවේ අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් කරනු ලැබේ. එම විගණකාධිපති වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ප්‍රධාන ලේකම්ගේ 2023 දෙසැම්බර් 29 දිනැති අංක 2023/12 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන ඡේදයේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි ප්‍රධාන ලේකම්ගේ 2023 දෙසැම්බර් 29 දිනැති අංක 2023/12 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යාම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ /ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තිය විනිශ්වය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වන බැවිණි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

02. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 ආදායම් කළමනාකරණය
------------------------------

සමාලෝචිත වර්ෂයට පූර්ව වර්ෂ 03 ක ඉඩම් හා අනෙකුත් බලපත්‍ර ගාස්තු ආදායම පිළිවෙලින් රු.169,768,129, රු.213,916,188 හා රු.221,424,900ක් ව තිබියදී, සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා අනෙක් බලපත්‍ර ගාස්තු ඇස්තමේන්තුව රු.215,000,000 ක් ලෙස දක්වා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේද සත්‍ය ආදායම රු.299,239,209 ක්ව තිබුණි. ඒ අනුව ආදායම් ඇස්තමේන්තු කිරීමේදී අඩුවෙන් ඇස්තමේන්තු කර ඇති බැව් නිරීක්ෂණය විය.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යසාධනය

3.1.1. කාර්යයභාරයන් ඉටු නොකිරීම.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 24 ට අදාලව දීර්ඝ කාලින ඉඩම් බලපත්‍ර හිමියන් 2,474 කගේ දීර්ඝ කාලින ඉඩම් බලපත්‍ර ගාස්තු රු.343,018,713 ක් හිඟව පැවති අතර බලපත්‍ර ගාස්තු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයන් සම්බන්ධයෙන් 2022 වර්ෂයේ සහ 2023 අගෝස්තු 30 දක්වා කාලය තුල රජයේ ඉඩම් ආඥා පනතේ 84/89 වගන්තිය යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත්තේ පුද්ගලයින් 18 දෙනෙකු සඳහා පමණි. ඒ අනුව හිඟ ආදායම් අයකර ගැනීමට හෝ බලපත්‍ර ගාස්තු නොගෙවීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.2. මෙහෙයුම අකාර්යක්ෂමතා

(i) ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ සඳහන් රු.12,701,632 ක් වටිනාකම වූ නිල නිවාස 02 ක් පිහිටි ඉඩම් සහ රු.400,000 ක් ලෙස දක්වා ඇති හිස් ඉඩමෙහි අයිතිය තහවුරු කෙරෙන හිමිකම් සහතික ලබාගෙන තිබූ බවට සාක්ෂි නොතිබුණි.

(ii) දීර්ඝ කාලින බදු බලපත්‍ර සකස් කිරීම සඳහා කැකිරාව හා තිරප්පනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල පැවති ඉඩම් කච්චේරි වලින් අනුමැතිය ලද එහෙත් අනුරේඛන සකස් නොකිරීම සහ පළාත් ඉඩම් කොමසාරිස් විසින් සිදුකල යුතු අමතර කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් එම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 02 හි පිළිවෙලින් ලිපිගොනු 221 ක් හා 34ක් ලෙස එකතුව ලිපිගොනු 253 ක කටයුතු වසර 1 – 10 ත් අතර ප්‍රමාද වී තිබුණි.

(iii) කැකිරාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ රජයේ දෙපාර්තමේන්තු සඳහා ඉඩම් හිමිකම් සහතිකය ලබා ගැනීමට ලැබී තිබුණු ආයතන 32 ක ඉල්ලීම් ඉටුකර නොතිබුණු අතර එය ප්‍රමාදය වසර 2 -14 දක්වා කාලයක් විය.

(iv) කැකිරාව සහ පලුගස්වැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 02ට අයත් පළාත් පාලන ආයතන සතු ඉඩම් පිළිවෙලින් 19 ක් සහ 01ක් වෙනුවෙන් පැවරුම් නියෝග ලබාගැනීම සඳහා ලද ඉල්ලීම් ඉටු කිරීමට වසර 11කට වඩා ප්‍රමාදවී තිබුණි.

(v) කැකිරාව, තිරප්පනේ හා පලුගස්වැව යන ප්‍රාදේශ ලේකම් කොට්ඨාශ 03ක අර්ධ රාජ්‍ය ආයතන සඳහා දීර්ඝ කාලින බලපත්‍ර ලබාදීමට ලැබි තිබූ ඉල්ලීම් පිළිවෙලින් 9ක් 2ක් හා 5ක් වශයෙන් එකතුව ඉඩම් ඉල්ලීම් 16ක කටයුතු වසර 2 – 25 අතර කාලයක් ප්‍රමාද වී තිබුණි.

(vi) කැකිරාව, පලුගස්වැව සහ තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල විහාරස්ථාන 47 ක පූජා භූමි දීමනාපත්‍ර ලබා දීමේ කටයුතු වසර 1-19 ත් අතර කාලයක් ප්‍රමාද වී තිබුණි.

3.3. වත්කම් කළමනාකරණය

-----------------------------

3.3.1. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

---------------------------------

2023 නොවැම්බර් 14 දින උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2023/07 ප්‍රකාරව සියළුම ආයතන 2023 වර්ෂයේ භාණ්ඩ සහ වත්කම් සමීක්ෂණය කළ යුතු බවත් වගන්ති අංක 09 ප්‍රකාරව 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව වාහන භෞතිකව සත්‍යාපනය කල යුතු බවට සඳහන්ව තිබූ නමුත් පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට වාහන භෞතිකව සත්‍යාපනයකර නොමැති බවට නිරීක්ෂණය විය.

04. මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

දෙපාර්තමේන්තුගත සහකාර ඉඩම් කොමසාරිස් තනතුර, දෙපාර්තමේන්තුවේ කාර්යයසාධනය කෙරෙහි සෘජුවම සම්බන්ධවන ජ්‍යෙෂ්ඨ ජනපද නිලධාරි තනතුරු 03 ක්, ජනපද නිලධාරි තනතුරු 8 ක් සහ ක්ෂේත්‍ර මැනුම් සහයක තනතුරු 03 ක් පුරප්පාඩුව පවතී.

ජේ.ඒ.එස්.ඇනස්ටින්, ජේ.ඒ.එස්. ඇනස්ටින් ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති ජාතික විගණන කාර්යාලය

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට

පිටපත්:- නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) - උතුරු මැද පළාත් සභාව